**ශීර්ෂය 240 - ජාතික අයවැය දෙපාර්තමේන්තුව**

**------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

**---------------**

### 1.1 මතය

**-------**

ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශය 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබදව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2020 මැයි 31 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2020 දෙසැම්බර් 21 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2019 දෙසැම්බර් 03 දිනැති අංක 271/2019 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව පිළියෙල කළ එම මූල්‍ය ප්‍රකාශනවලින් 2019 දෙසැම්බර් 31 දිනට ජාතික අයවැය දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 මතය සඳහා පදනම

**-------------------**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

**----------------------------------------------------------------------------------------------------**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරනගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදිම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති සම්පිණ්ඩන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශයන්ගෙන් අනාවරණය කරගන්නා බවට තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇති විය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා  අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී.  වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ දූස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන්හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වංචාවක් ඇතිවීමට හේතුවන බැවිනි.

- දෙපාර්තමේන්තුවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල  උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම ඇතුළත් මූල්‍ය ප්රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) වගන්තිය හා 38 වන වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට ,

(ආ) පසුගිය වර්ෂයේ ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ වාර්තාවෙන් පෙන්වා දෙන ලද නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 ආදායම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| 2015 වර්ෂයේ අයවැය යෝජනාවකට අනුව රජයේ නිලධාරීන්ට ලබාදුන් යතුරුපැදි සම්බන්ධ මූලික ගෙවීම් ගිණුම්ගත කිරිමේ අරමුණින් හඳුන්වා දුන් ආදායම් ශීර්ෂය යටතේ 2015 වර්ෂයේ ආදායම් රැස්කර තිබුණි. එහෙත් 2016 වර්ෂයේ සිට දළ ආදායම් රැස් කිරීම් රු.මිලියන 222 ක්, ආදායමින් ආපසු ගෙවීම් රු.මිලියන 101 ක් හා ශුද්ධ ආදායම රු. මිලියන121 ක් ලෙස වැරදි ගිණුම්ගත කිරීම් නිවැරදි කිරීමට පමණක් මෙම ආදායම් ගිණුම සීමාවී තිබුණි. ඒ තුළ 2016 හා 2017 වර්ෂවල මුදලින් ආපසු ගෙවීම් එකතුව රු.මිලියන28 ක් විය. 2016 වර්ෂයේ සිට මේ දක්වාම ගිණුමට ආදායම් ලැබීම සිදුවන නමුත් ලැබිය යුතු ශේෂ පවතීද පිළිබඳව තහවුරු කරගෙන නිවැරදි කිරිම් කිරීමට පියවර ගෙන නොතිබුණි. | නිවැරදි කිරිම් හැකි ඉක්මනින් අවසන් කිරීමට පියවර ගත යුතු වේ. | යතුරුපැදි සඳහා හිමිකම් ලබන නිලධාරීන් සේවය කරන කාර්යාල වලට ආදායම් ගිණුම්ගත කළ යුතු ආකාරය පිළිබඳව උපදෙස් ලබාදී තිබුණද එම කාර්යාල විසින් වැරදි සහගත ලෙස වෙනත් ගිණුම්වලට එම ආදායම බැර කිරීම සිදුකර ඇත. එම වැරදි ගිණුම්ගත කිරීම නිවැරදි කරන ලෙස වරින් වර උපදෙස් දී ඇති අතර නිවැරදි කිරීම් හැකි ඉක්මනින් අවසන් කිරීමට කටයුතු යොදා ඇත. |

### 2.2 වියදම් කළමනාකරණය

| විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| **ඇස්තමේන්තු සකස් කිරීමේ දුර්වලතා**<br>(අ) වැඩසටහන **01**<br>(i) වැය විෂයයන් 02 ක එකතුව වූ රු.මිලියන 4.7ක ප්‍රතිපාදන මු.රෙ. 66/69 ප්‍රතිපාදන යටතේ සියයට 20 සිට සියයට 440 දක්වා වැඩි කිරීම් ද වැය විෂයයන් 08 ක එකතුව වූ රු.මිලියන 66.6 ක ප්‍රතිපාදන සියයට 11 සිට සියයට 27 දක්වා අඩු කිරීම් ද සිදු කර තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කල යුතුවේ. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී මුදල් රෙගුලාසි හා විසර්ජන පනතේ විධිවිධාන අනුව ප්‍රතිපාදන මාරුකිරීම් කර සමස්ථ ප්‍රතිපාදනය කළමනාකරණය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. |

| | | |
|---|---|---|
| (ii) 2019 වර්ෂයේ පුනරාවර්තන වැය විෂයයක් යටතේ මූලික ඇස්තමේන්තු ලෙස රු.මිලියන 525 ක් හා පරිපූරක වෙන් කිරීම් මඟින් රු.මිලියන 52 ක් වෙන් කර තිබුණු අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.මිලියන1.7 ක මුදලක් ඉතිරි වී තිබුණි. එසේම ප්‍රාග්ධන වැය විෂයයක් යටතේ පරිපූරක ඇස්තමේන්තු හා මු.රෙ. 66/69 යටතේ එකතුව රු.මිලියන 19.6 ක ප්‍රතිපාදන මාරු කර තිබුණි. | -එම- | -එම- |

(ආ) **වැඩසටහන 02**

-----------------

| | | |
|---|---|---|
| **i.** ව්‍යාපෘතිය 02 හි මූලධන වැය විෂයයන් 04 ක රු.මිලියන 34,377 ක් වූ ප්‍රතිපාදන මු.රෙ. 66 යටතේ සියයට 15 සිට සියයට 100 දක්වා වැඩි කිරීම්ද, රු. මිලියන 40,129.5ක් වූ පුනරාවර්තන වැය විෂයයක ප්‍රතිපාදන සියයට 13 දක්වා අඩු කිරීම්ද සිදු කර තිබුණි. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කල යුතුවේ. | ඇස්තමේන්තු හැකිතාක් නිවැරදිව සකස් කර ඇති අතර අවශ්‍ය අවස්ථාවලදී මුදල් රෙගුලාසි හා විසර්ජන පනතේ විධිවිධාන අනුව ප්‍රතිපාදන මාරුකිරීම් කර සමස්ථ ප්‍රතිපාදනය කළමනාකරණය කිරීමට දෙපාර්තමේන්තුව කටයුතු කර ඇත. |
| **ii.** ව්‍යාපෘතිය 03 හි මූලධන වියදම් සඳහා වූ රු.මිලියන 49,525 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් ඉතිරි වී තිබුණි. | - එම - | යෝජනා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ රේඛීය අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන ඉල්ලුම් නොකරන අවස්ථාවලදී සහ යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්දයෙන් සෑහීමකට පත්විය නොහැකි අවස්ථාවලදී ප්‍රතිපාදන මුදානොහරින බැවින් මෙහිදී සකසන ලද ඇස්තමේන්තු වල නිරවද්‍යතාවය පිළිබඳ කිසිදු ගැටළුවක් නොමැත. |
| **iii.** ව්‍යාපෘතිය03 හි පුනරාවර්තන වැය විෂයයන් 02 ක හා මූලධන වැය විෂයයන් 11 ක එකතුව රු. මිලියන4,075 ක් වූ ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිය සියයට 100 ක් වූ අතර පුනරාවර්තන වැය විෂයයන් 03 ක රු.මිලියන | -එම- | -එම- |

| | | |
|---|---|---|
| 1,500 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 32 සිට සියයට 63 දක්වා පරාසයක ද ප්‍රාග්ධන වැය විෂයයන් 12 ක රු.මිලියන 10,300 ක් වූ මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් ඉතිරිවීම් සියයට 20 සිට සියයට 85 දක්වා පරාසයක ද විය. | | |
| iv. ව්‍යාපෘතිය 03 හි පුනරාවර්තන වැය විෂයයන් 02 ක රු.මිලියන11,000 ක් වූ මූලික ඇස්තමේන්තුවෙන් මු.රෙ. 66 යටතේ සියයට 60 ක් හා සියයට 80 ක් අඩු කිරීම් සිදු කර තිබුණි. | -එම- | -එම- |
| v. වැය විෂය අංක 2509-27 යටතේ මූලික ඇස්තමේන්තුවක් සිදු කර නොතිබුණු අතර 2019 වර්ෂයේදී මු.රෙ. 66 මාරු කිරීම මඟින් රු. මිලියන 100 ක් මෙම වැය විෂයට මාරු කර තිබුණි. | -එම- | -එම- |

## 2.3. රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම පිළිබඳ සැසඳුම් ප්‍රකාශය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|
| (අ) මිය ගිය නිලධාරීන් දෙදෙනෙකුගෙන් අයවිය යුතු එකතුව රු. 305,621 ක් වූ ණය ශේෂය වසර 18 කට අධික කාලයක සිට අයවිය යුතුව පවතින අතර මෙය පසුගිය විගණන විමසුම් මගින් ද පෙන්වා දී තිබුණි. එම ණය ශේෂයන් 2019 දෙසැම්බර් 31 දින වන විටදීත් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ණය ශේෂ නිරවුල් කිරීමට හැකි සෑම පියවරක්ම ගත යුතු වේ. | ණය ශේෂ නිරවුල් කිරීමට හැකි සෑම පියවරක්ම ගෙන ඇත. 2019 දෙසැම්බර් 31 දිනට පැවති ශේෂයෙන්ද මේ වනවිට රු. 101,561.30 ක මුදලක් අයකර ගැනීමට කටයුතු කර ඇත. |

| | | | |
|---|---|---|---|
| **(ආ)** | එසේම සේවය හැර ගොස් ඇති නිලධාරියෙකුගෙන් අයවිය යුතු රු.150,119 ක් වූ ණය ශේෂය අයකර ගැනීම සම්බන්ධව මීට පෙර වර්ෂ කිහිපයකදීද විගණන විමසුම් මඟින් පෙන්වා දී තිබුණද, එම ශේෂයන් අයකර ගැනීමට මෙතෙක් හැකි වී නොතිබුණු බව නිරීක්ෂණය විය. | -එම- | -එම- |

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
|---|---|---|---|
| (අ) | අයවැය යෝජනා වලට අදාල රු. මිලියන 49,525 ක් වූ මුළු මූලධන ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 22 ක් ඉතිරිවී තිබුණි. | අයවැය යෝජනා ආර්ථිකභාවයෙන්, ඵලදායිව හා කාර්යක්ෂමව ඉටු කිරීමට නිලධාරීන් කටයුතු කළ යුතු වේ. | යෝජනා ක්‍රියාත්මක කිරීමේ වගකීම දරණ රේඛීය අමාත්‍යාංශ විසින් ප්‍රතිපාදන ඉල්ලුම් නොකරන අවස්ථාවලදී සහ යෝජනා ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සම්බන්දයෙන් සෑහීමකට පත්විය නොහැකි අවස්ථාවලදී ප්‍රතිපාදන මුදානොහරින බැවින් මෙහිදී සකසන ලද ඇස්තමේන්තු වල නිරවද්‍යතාවය පිළිබඳ කිසිදු ගැටළුවක් නොමැත. |
| (ආ) | අයවැය යෝජනා 13 ක රු.මිලියන 4,075 ක් වූ මුලු ශුද්ධ ප්‍රතිපාදනයෙහි ඉතිරිය සියයට 100 ක් විය. | -එම- | -එම- |
| (ඇ) | අයවැය යෝජනා 03 ක මුළු පුනරාවර්තන ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන1,500 ක මුදලින් ඉතිරිවීම් සියයට 32 සිට සියයට 63 දක්වා පරාසයක විය. | -එම- | -එම- |
| (ඈ) | අයවැය යෝජනා 12 ක මුළු මූලධන ශුද්ධ ප්‍රතිපාදනය වූ රු.මිලියන 10,300 ක මුදලින් ඉතිරිවීම් සියයට 20 සිට සියයට 85 දක්වා පරාසයක විය. | -එම- | -එම- |

| | | | |
|---|---|---|---|
| (ඉ) | අයවැය යෝජනා 04 ක රු.මිලියන 32,000 ක් වූ මූලික ඇස්තමේන්තුවෙන් මු.රෙ. 66 යටතේ සියයට 10 සිට සියයට 80 දක්වා අඩු කිරීම් සිදු කර තිබුණි. | -එම- | -එම- |
| (ඊ) | අයවැය යෝජනා යටතේ පාසල් ළමුන් සඳහා නොමිලේ කිරි වීදුරුවක් ලබාදීමට රු.මිලියන 1,000ක පුනරාවර්තන වියදමක් වෙන් කර තිබුණ අතර පසුව ඉන් රු. මිලියන 100 ක් මූලධන වියදම් වලට මු.රෙ.66 යටතේ මාරු කර තිබුණ බව නිරික්ෂණය විය. | -එම- | -එම- |

**3.2 කළමනාකරණ දුර්වලතා**

---------------------------

පහත සඳහන් නිරික්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරික්ෂණය | නිර්දේශය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම |
|---|---|---|---|
| (අ) | තාවකාලිකව තැන්පතු රඳවා ගන්නා ගිණුමක 2019 දෙසැම්බර් 31 දිනට රු. මිලියන 177.5ක ශේෂයක් පැවතුණි. මෙම තැන්පතු ගිණුම තුළ රාජ්‍ය සේවයේ ක්ෂේත්‍ර නිලධාරීන් විසින් මෝටර් බයිසිකල් ණය නිරවුල් කර ගැනීම සඳහා ගෙවූ රු. මිලියන116.7 ක මුදලක් අනෙකුත් ලැබීම් ආදායම් ගිණුමට බැර කර තිබුණි. | නිරවුල් කිරීමේ කටයුතු කඩිනමින් අවසන් කිරීමට පියවර ගත යුතු වේ. | බයිසිකල් 146,381 ක වාරික සහ ඊට අදාල පොලී ලොට් අංක 40 ක් යටතේ කාණ්ඩ ගතකර ගෙවීම් කරනු ලබන බැවින් මේ යටතේ වන තැන්පතු අදාල මෝටර් බයිසිකලය වෙනුවෙන්ම නිරවුල් කිරීමේ හැකියාවක් නොමැත. |
| (ආ) | ජාතික අයවැය දෙපාර්තමේන්තුව විසින් විගණනයට සපයන ලද තොරතුරු අනුව මූල්‍ය කල්බදු යටතේ 2011-2012 වර්ෂවල වාහන 2,067 ක් මිලදී ගෙන තිබුණු අතර ඉන් වාහන 792 ක් අදාල දෙපාර්තමේන්තු නමින් පවරා ගෙන තිබුණි. එසේම වාහන 169 ක් පවරා ගැනීම සිදු කෙරමින් පවතින බව දැනුම් දී ඇති අතර වාහන 1106 කට අදාලව පැවරීම පිළිබඳ තොරතුරු ලබාදී නොමැති බව දන්වා ඇත. 2014 වර්ෂයේදී (CHOGM) Common Heads of Government Ministry සඳහා වාහන 179 ක් මිලදී ගෙන තිබුණි.ඉන් වාහන 173 ක් (කෝස්ටර් බස් 29 ක්, කාර් 144 ක්) පිළිබඳ පවරාගත් විස්තර විගණනයට ඉදිරිපත් නොවීය. | පැවරීමේ කටයුතු අවසන් කිරීමට පියවර ගතයුතු වේ. | මූල්‍ය කල්බදු යටතේ මිලදී ගත් වාහන ලියාපදිංචි කර ඇත්තේ අදාල ආයතන ප්‍රධානීන්ගේ නමින් වන බැවින්, වාහන පවරා ගන්නා ලෙස එම ප්‍රධානීන්ටත්,<br>වාහන පවරා දෙන ලෙස ලංකා බැංකුවට හා මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවටත් ලිඛිත උපදෙස් ලබාදී ඇත. මේ සම්බන්ධයෙන් අයවැය දෙපාර්තමේන්තුව මගින් සිදුකළ යුතු කාර්යය නිසි ලෙස ඉටුකර ඇති බැවින් එම වගකිවයුතු පාර්ශවයන් විසින් අදාල පවරා ගැනීම් කටයුතු සිදුකර ගත යුතුව ඇත. |

4. **මානව සම්පත් කළමනාකරණය**

**-----------------------------------**

| **විගණන නිරීක්ෂණය** | **නිර්දේශය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** |
| --- | --- | --- |
| ------------------- | ---------- | ------------------------------------- |
| සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 08 ක්, ද්විතීයික මට්ටමේ තනතුරු 07 ක් හා ප්‍රාථමික මට්ටමේ තනතුරු 03 ක් ලෙස පුරප්පාඩු 18 ක් පවතින බවත් එම පුරප්පාඩු හේතුවෙන් රාජකාරී කටයුතු ඉටු කිරීමේදී දුෂ්කරතාවයන්ට මුහුණ දීමට සිදුව ඇති බවත් (කාර්යසාධන වාර්තාව පරිදි) නිරීක්ෂණය කෙරේ. | පුරප්පාඩු පිරවීමට හෝ අනුමත කාර්ය මණ්ඩලය සංශෝධනය කිරීමට හෝ කටයුතු කළ යුතු වේ. | පුරප්පාඩු පවතින තනතුරු සම්පූර්ණ කරන ලෙස වරින් වර ඉල්ලීම් ඉදිරිපත් කර ඇති නමුත්, මෙතෙක් ඒ සඳහා නිලධාරීන් ලැබී නොමැත. |